# බළන්ගොඩ නගර සභාව

## 2025-08-27 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.08.27**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ සී. චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී. අනතුරුව බළන්ගොඩ නගර සභාව සතු පහත දේපළ බදුදීම, සේවාවන් සඳහා ටෙන්ඩර් කැඳවීම වෙනුවෙන් වන ටෙන්ඩර් කොන්දේසි සඳහා අනුමැතිය ලබා ගැනීම සහ සංශෝධනය කිරීම, අවම ලංසු මුදල තීරණය කිරීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

- ❖ බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම සහ පිරිසිදු කර පවත්වා ගෙන යාමේ ටෙන්ඩරය
- ❖ පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය, අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය, අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය යන ටෙන්ඩරය
- ❖ පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14,18 දරණ මාළු කඩ ටෙන්ඩරය
- ❖ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය
- ❖ බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය
- ❖ මහජන පොළ ආපනශාලාව ටෙන්ඩරය

01. **බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම සහ පිරිසිදු කර පවත්වාගෙන යාමේ ටෙන්ඩරය**

බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම සහ පිරිසිදු කර පවත්වාගෙන යාමේ ටෙන්ඩරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීම අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා පවසන ලදී. ඒ අනුව පහත පරිදි ගරු සභිකවරුන් විසින් කසළ ටෙන්ඩරයේ ටෙන්ඩර් කොන්දේසි වලට සංශෝධන ලෙස ඇතුළත් විය යුතු යෝජනා ඉදිරිපත් කරන ලදී.

❖ **ගරු උපසභාපති ජේෂල නිකලන්ද මැතිතුමා**

කසළ එකතු කිරීමේ සැලැස්මට ඕළුගන්තොට කොට්ඨාශයේ ජනපද පාර සහ පුරණගෙදර මාර්ගය ඇතුළත් කිරීම

❖ **ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

බෝම්බුව කොට්ඨාශයේ වතුකාරගොඩ , කොටුගොඩැල්ල , උඩකන්ද ගල්වල මාර්ගය යන මාර්ග වල කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටර් රථ යෙදවීම හා ට්‍රැක්ටර් රථ ධාවනය කිරීමට නොහැකි මාර්ග සඳහා අත් කරත්ත යොදවා සතියකට දෙවතාවක් කසළ එකතු කිරීම.

❖ **ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා**

දෙහිගස්තලාව කොට්ඨාශයට අයත් කුමාරගම කෙත්තාරාම පන්සල දක්වා කසළ එකතු කිරීම.

❖ **ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා**

බළන්ගොඩ නගරයේ පවතින විවෘත කාණු තුළ විශාල කැලි කසළ ප්‍රමාණයක් එක් රැස්වන බැවින් ද ඒවා පිරිසිදු කිරීමට සභාවේ කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින් ද කසළ ටෙන්ඩරයට බළන්ගොඩ නගරය සීමාව තුළ ඇති විවෘත කාණු පිරිසිදු කිරීම ඇතුළත් කිරීම.

- **ගරු නාගරික මන්ත්‍රී එන්.ජී.එස්.චන්දන මැතිතුමා**

  බළන්ගොඩ නගර සභාව සතු තුරු උයන පරිශ්‍රය මේ වන විට පිරිසිදු කිරීම් සිදුකරන්නේ සභාවේ කම්කරුවන් යෙදවීමෙන් බැවින්, කසළ ටෙන්ඩරයේ කොන්දේසී වලට තුරු උයන කොටස පිරිසිදු කිරීම ද ඇතුළත් කිරීම සහ කසළ එකතු කිරීමේ දෙවන සේවා මුරය ආරම්භ වන වේලාව මේ වන විට ප.ව.02.00 යන්න ප.ව.03.30 ලෙස සංශෝධනය කිරීම.

- **ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා**

  කිරිදිගල කොට්ඨාශයේ තොසිල ගාර්ඩන් හි කසළ එකතු කිරීම මේ වන විට සිදු නොවන බැවින්, එය කසළ එකතු කිරීමේ සැලැස්මට ඇතුළත් කිරීම , වැලිහරනාව මාර්ගයේ කසළ ට්‍රැක්ටර් රථය මගින් හරවන බැවින්, අමල් මුදලාලීගේ නිවස දක්වා ට්‍රැක්ටර් රථ යෙදවීම. අනදමෙත්ගම මාර්ගයේ නොදිරන කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටර් රථ යෙදවීම සහ බළන්ගොඩ නගර සභාව මගින් ට්‍රැක්ටර් රථ ධාවනය කිරීමට නොහැකි මාර්ග වල කසළ එකතු කිරීම සඳහා මිළදී ගැනීමට අපේක්ෂිත ඩීසල් ත්‍රීරෝද රථය ශෛලතලාරාම මුගුණමලය දක්වා යෙදවීම.

- **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා**

  කසළ ටෙන්ඩරයේ කොන්දේසි තුළ සේවකයින් 16 දෙනෙකු යොදවා ගන්නා බවට සඳහන් වන බැවින්, මෙම කොන්දේසී නිශ්චිත වශයෙන්ම ඒ ආකාරයෙන්ම සිදුවෙනවා ද යන්න විධිමත්ව අධීක්ෂණය කිරිම.

- **ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය**

  මහමෙව්නා මාවතේ කසළ එකතු කිරීම සඳහා අත් කරත්ත යෙදවීම.

- **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා**

  ඇල්ලෙපොල පාසල දක්වා කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටර් රථය යෙදවීම.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී වසන්ත ගුණරත්න මැතිතුමා තම අදහස් දක්වමින් පවසා සිටියේ සභිකවරුන් ඉදිරිපත් කරන ලද ඇතැම් මාර්ගවල ට්‍රැක්ටර් රථ ගොස් ආපසු හැරවීමට නොහැකි බවත්, නමුත් එම මාර්ගවල කසළ එක්රැස් කිරීම වෙනුවෙන් අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග අනිවාර්යෙන් ගත යුතු බවත්, මෙම ටෙන්ඩරය ලබා ගත්තද ටෙන්ඩර්කරුවන්ගේ පාර්ශවයෙන් බලන කළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී පහසු නොවන බවත්, එබැවින් නව කොන්දේසි ඇතුළත් කිරීමේදී මුදලද සංශෝධනය කිරීමට සිදු වනු ඇති බවත් ය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පෙ.ව 10.16 ට සභාවට පැමිණෙන ලදී.**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා තම අදහස් දක්වමින් පැවසූයේ, සමහර මාර්ගවල ට්‍රැක්ටර් රථ ධාවනය කළ නොහැකි බවත්, කාණු පිරිසිදු කිරීම ආදී සියළුම දෑ ඇතුළත්

කළහොත් ටෙන්ඩර් ගාස්තුවද වැඩි කිරීමට සිදු වනු ඇති බවත්, ටෙන්ඩර්කරු සහ සභාව යන දෙපාර්ශවයම කෙරෙහි අවධානය යොමු කර කොන්දේසි ඇතුළත් කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාගේ අදහස සත්‍ය බවත්, සංශෝධිත කොන්දේසි ඇතුළත් කර ටෙන්ඩරය ක්‍රියාත්මක කළ හැකි සාධාරණ මුදලකට එය ලබා දිය යුතු බවත්, මෙම කොන්දේසි ඇතුළත් කිරීමෙන් ටෙන්ඩර්කරුට අසාධාරණයක් කිරීමට බලාපොරොත්තු නොවන බවත්, අවශ්‍ය වන්නේ කොන්දේසි ඇතුළත් කර ඒවා ඉටුවනවාද යන්න බැලීම පමණක් බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පවසා සිටියේ ට්‍රැක්ටර් රථ ධාවනය කළ නොහැකි මාර්ගවල කසළ එකතු කිරීම සඳහා අනිවාර්යෙන් විකල්පයක් ලෙස ත්‍රීරෝද රථයක් යෙදවීම සිදු කළ යුතු බවත් බදු ගෙවන ජනතාවට ට්‍රැක්ටර් රථ හැරවිය නොහැකි බැවින් කසළ එකතු කිරීම සිදු කළ නොහැකි බව පැවසිය නොහැකි බවත්ය.

අනතුරුව කසළ එකතු කිරීමේ කටයුතු අධීක්ෂණ නිලධාරිනීගෙන් ගරු සභිකවරුන් ඉදිරිපත් කරන ලද කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව කාරක සභාවේ සාකච්ඡා කරගත් කරුණු අනුව

- ❖ කසළ ටෙන්ඩරයේ කොන්දේසි තුළට ඉහත ගරු සභිකවරුන් විසින් සංශෝධන ලෙස ඉදිරිපත් කරන ලද යෝජනා ඇතුළත් කිරීම.
- ❖ ට්‍රැක්ටර් රථ ධාවනය කළ නොහැකි මාර්ගවල කසළ එකතු කිරීම සඳහා ටෙන්ඩර් කොන්දේසි තුළට කුලී පදනම මත හෝ ත්‍රීරෝද රථයක් යොදවා කසළ එකතු කළ යුතු බව ඇතුළත් කිරීම.
- ❖ කසළ එකතු කිරීමේ රාත්‍රී වැඩ මුරය අධීක්ෂණයක් සිදු නොවන බැවින් අධීක්ෂණය සඳහා නිලධාරියෙකු යෙදවීමටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එකී සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.**

**02. පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14,18 දරණ මාළු කඩ ටෙන්ඩරය**

පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14,18 දරණ මාළු කඩ ටෙන්ඩරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ 2024.11.19 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් නව තක්සේරුව මත පදනම් වූ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය

නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

ඒ අනුව ඉහත මාළු කඩ කාමර වල දැනට තිබෙන අවම ලංසු මුදල පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා, සභාව මගින් දැරීමට සිදුවන වැය සහ මාළු වෙළඳාම මගින් කඩ හිමියන් ලබා ගන්නා ලාභය මත පදනම්ව පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14 දරණ මාළු කඩ සඳහා අවම ලංසු මුදල රු.24,500 ක් විය යුතු බවටත්, පොදු වෙළඳසැළ අංක 18 දරණ මාළු කඩ කාමරය සඳහා අවම ලංසු මුදල රු.36,500 ක් විය යුතු බවටත් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පවසා සිටියේ පොදු වෙළඳසැළේ මාළු කඩ කාමර හිමියන් ටෙන්ඩර් මගින් ලබාගෙන මාළු වෙළදාම් විධිමත්ව සිදුකල ද , නගරයේ වෙනත් ස්ථාන වලත් මාළු වෙළදාම සිදුවන බවත්, මහජන පොළ ගබඩා ලෙස ලබා දී ඇති කඩ කාමර භාවිතා වන්නේ ගබඩා ලෙස නොව මාළු වෙළදාම සඳහා බවත්, ඉහත යෝජනා වු පරිදි මාළු කඩ කාමර වල අවම ලංසු මුදල වැඩිකිරීමක් සිදුකරන්නේ නම්, එම මාළු වෙළදාම සිදුවන ගබඩා සඳහාද , අයකරන මුදල වැඩි කිරීම සිදුකල යුතු බවත්,

එමෙන්ම, මහජන පොළ ගබඩා වල මාළු වෙළදාමේ නිරත වන වෙළදුන් දීර්ඝ කාලීන බදු පදනම මත එම කඩ කාමර ලබාගැනීමට ඉල්ලීම් සිදුකර ඇති බවද , පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ පොදු වෙළඳසැල ගොඩනැගිල්ල කඩා ඉවත් කර නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, සංවර්ධනය වු පසු දැනට එම කඩ කාමර හිමියන් වෙත කඩ කාමර ලබා දීමට ප්‍රමුඛතාවය ලබාදෙන බවත් එවිට මහජන පොළ ගබඩා හිමියන්ගේ ද ඉල්ලීම් සලකා බලා දිර්ඝ කාලීන බදු පදනම මත කඩ කාමර ලබාදීමේ හැකියාවක් පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්, ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන්.සේනාරත්න මැතිතුමාගේ යෝජනාවට සම්පූර්ණයෙන්ම විරුද්ධ වන බවත්, එසේම 100% ක් ලංසු මුදල වැඩිකිරීම ඉතා අසාධාරණ බවත්, සභාව මගින් එසේ ලංසු මුදල 100% වැඩිකිරීමට තීරණය කල ද ඊට තමන් විරුද්ධ වන බවත්, අවසානයේ මෙම මුදල පාරිභෝගිකයා වෙත එල්ල විය හැකි බවත්, ප්‍රකාශ කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාද ඉහත ලංසු මුදල 100% වැඩි කිරීමට තමන් විරුද්ධ බවත්, එය අසාධාරණ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඉහත ලංසු මුදල යම් කිසි ප්‍රතිශතයක් වැඩි කළද 100% වැඩි කිරීමට තමන් විරුද්ධ බවත්,එය ඉතා අසාධාරණ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන්.සේනාරත්න මැතිතුමා, තමන් ඉහත මාළු කඩ කාමර සඳහා අවම ලංසු මුදල රු.24500 ක් විය යුතු බවට යෝජනා කරනු ලැබුවේ මාළු වෙළඳුන් දිනකට ලැබිය හැකි සාමාන්‍ය ලාභය රු.50000 ක් පමණ  බවට අදහස් කරමින් බවත්, සභාවට ආදායම වැඩිකරගැනීමේ අදහසින් බවත්, සභාව  ඊට විරුද්ධ වන්නේ නම්,එය පිළිගන්නා බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින්, පොදු වෙළඳසැල වෙත පාරිභෝගකයින් පැමිණෙන්නේ මස් හා මාළු කඩ හේතුවෙන් පමණක් බවත් , මෙම ස්ථානයේ වෙනත් කිසිදු වෙළඳාමකට වෙළඳාම් සිදුවන ප්‍රමාණය ඉතා අඩු බවත්, එබැවින් එම ව්‍යාපාරිකයින් ආරක්ෂා කල යුතු බවත්, සාකච්ඡා කර යම් කිසි ප්‍රතිශතයකින් පමණක් අවම ලංසු මුදල වැඩිකිරීම සිදුකළ යුතු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා පවසා සිටියේ සභාව මගින් සාකච්ඡා කර ඉහත මාළු කඩ වල අවම ලංසු මුදල යම් කිසි සාධාරණ මුදලක් වැඩි කිරීම කළ යුතු බවත් එසේ නොමැති නම් සභාව මගින් නගර වැසියන්ට ලබාදෙන සේවාවන් පවත්වාගෙන යාමේ ගැටළු ඇති විය හැකි බවත්, මීට පෙර පැවති රජයන් මගින් පොදු වෙළඳසැල සංවර්ධනය කිරීම සිදු කළ යුතුව පැවති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය මහජන පොළ ගබඩා ලෙස ලබා දී ඇති මාළු වෙළඳාම සිදුකරන කඩ කාමර වලින් අයකරනු ලබන මුදල පිළිබඳව විමසීම් කරන ලදුව මේ සඳහා පිළිතුරු ලබාදීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උපසභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව මහජන පොළ ගබඩා ලෙස ලබා දී ඇති මාළු වෙළඳාම සිදුවන කඩ කාමර පිළිබඳව ඇතිවූ දීර්ඝ සාකච්ඡාවෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

පොදු වෙළඳසැළ මාළු කඩ කාමරවල දැනට පවත්නා අවම ලංසු මුදල යම්කිසි ප්‍රතිශතයකින් වැඩි කිරීමට සභාවේ බහුතරයක් විරුද්ධ නොවන බැවින්,වැඩි කළ යුතු ප්‍රතිශතය පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ, පොදු වෙළඳසැළ මාළු කඩ අවම ලංසු මුදල වැඩිකරන්නේ නම් සියළුම මාළු කඩ ටෙන්ඩර් කර අයකරන ගාස්තුවද වැඩි කිරීම කළ යුතු බවත් එසේ නොකරන්නේ නම් තමන් විරුද්ධ වන බවත්ය.

මෙම පොදු වෙළඳසැළ මාළු කඩ ටෙන්ඩර් කැඳවන්නේ විවෘත ටෙන්ඩර්ද, ප්‍රාදේශීය ටෙන්ඩර්ද යන්න ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් විමසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා, බළන්ගොඩ නගරය, බළන්ගොඩ නගර සභාව පවතින්නේ බළන්ගොඩ ව්‍යාපාරික ජනතාව හේතුවෙන් බැවින් මෙම ටෙන්ඩරය ප්‍රාදේශීය ටෙන්ඩර් කැඳවීම සිදු කළ යුතු බව එතුමාගේ අදහස බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ අදහසට විරුද්ධ බවත්, පාරිභෝගික ජනතාවගේ පාර්ශවයෙන් ඉතා සාධාරණ මුදලකට මාළු මිලදී ගැනීමටනම් තරගකාරිත්වයක් තිබිය යුතු බැවින් මෙය විවෘත ටෙන්ඩර් කැඳවීමක් අනිවාර්යෙන් සිදු කළ යුතු බව පවසන ලදී.
පසුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ටෙන්ඩර් ක්‍රමවේදය පිළිබඳව බෙදීමක් ඉල්ලා සිටින ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසූයේ පොදු වෙළඳසැළ මාළු කඩ ටෙන්ඩර් කිරීමේ ක්‍රමවේදය (ප්‍රාදේශීයද/ දේශීයද යන්න) පිළිබඳව සභාවේ මත දෙකක් පළ වී ඇති බැවින් ටෙන්ඩර් ක්‍රමවේදය පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේනතුවේ ප්‍රජා සංවර්ධන නිලධාරී ඩබ්.එම්.ජී වීරසිංහ මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව

- පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14,18 දරණ මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා විවෘත ක්‍රමවේදය මඟින් ටෙන්ඩර් කැඳවීම සුදුසු බවටත්,
- පොදු වෙළඳසැළ අංක 09,10,11,12,14 යන කඩ කාමර සඳහා අවම ලංසු මුදල රු.24,500 විය යුතු බවටත් ,
- පොදු වෙළඳසැළ අංක 18 කඩ කාමරය සඳහා අවම ලංසු මුදල රු.36,500 විය යුතු බවටත් වන යෝජනාව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ සම්මත විය.**

පසුව මෙම යෝජනාවට තමන් විරුද්ධ වන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, එම්.ටී.එම් රුමි මැතිතුමා, එම්.නිමල් කරුණාරත්න මැතිතුමා, එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, එම්.ඩබ්.විමලසිරි මැතිතුමා යන සභිකවරුවන් අත් ඔසවා ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය යන ගරු සභිකවරුන් ප්‍රකාශ කලේ තමන් ඉහත යෝජනාවට විරුද්ධ වන බවත් මාළු වෙළඳාම සඳහා මහජන පොළ ගබඩා යොදා ගත නොහැකි බවත්, ඊට තමන් විරුද්ධ වන බවත් මාළු වෙළඳාම එකම තැනකට රැගෙනවිත් ටෙන්ඩර් කිරීම සුදුසු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ එම මාළු වෙළඳාම එකම තැනකට රැගෙනඒමේ කාර්යය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බවත් එයට වෙනම යෝජනා සම්මත කර ගෙන සිදු කිරීම සුදුසු බවත්ය.

**03. පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය, අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය, අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය යන ටෙන්ඩරය**

**3.1 පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය**

පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ 2024.11.19 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් නව තක්සේරුව මත පදනම් වූ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල වන රු.12,375 මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා එකී කඩ කාමරයේ අවම ලංසු මුදල රු.24,500 ක් විය යුතු බවට යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අවස්ථාවේ ඉහත යෝජනා සම්බන්ධයෙන් සභාවේ බෙදීමකට යා යුතු බවට වූ මත ගැටුමක් සිදු විය. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරයේ අවම ලංසු මුදල දැනට තිබෙන තක්සේරු මුදලින් 5% ක් වැඩි කළ යුතු බවට යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා, ඉහත පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරයේ අවම ලංසු මුදල දැනට තිබෙන තක්සේරු මුදලින් 10% ක් වැඩි කළ යුතු බවට යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසූයේ තමන් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බවත් 10% ක ප්‍රතිශතයකින් වැඩි කිරීමට වන ඉහත යෝජනාව ඉදිරියට ගෙන යන ලෙසත්ය.

ඒ අනුව මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවටත් ඒ සඳහා විවෘත ඡන්දයක් පැවැත්වීමටත්, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා යෝජනා කළ අතර,ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා විසින් යෝජනා කරන ලද පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරයේ අවම ලංසු මුදල රු.24,500 ක් කිරීමේ යෝජනාව සඳහා පැවති විවෘත ඡන්ද විමසීමට අනුව යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකු ද, එනම්,

1. ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
2. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රි එන්.ඒ.එස් චන්දන මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 07 දෙනෙකු ද, එනම්,

1. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම් රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
7. ගරු නාගරික මන්ත්‍රි එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා ලෙස සභිකවරුන් තම ඡන්දය භාවිතා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය මෙදින ගරු සභාවට නොපැමිණි සභිකයා වේ.

ඒ අනුව ඉහත පොදු වෙළඳසැළ අංක 15 දරණ එළු මස් කඩ කාමරයේ අවම ලංසු මුදල රු.24,500 ක් කිරීමේ යෝජනාව වැඩි ඡන්ද 01 කින් සභා සම්මත විය.

**3.2 පොදු වෙළඳසැල අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය**

පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ 2024.11.19 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් නව තක්සේරුව මත පදනම් වූ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල වන රු.450,000 මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය, මේ සම්බන්ධව අතුරු ව්‍යවස්ථාව පවතින බැවින් එහි ගෙන ඇති තීරණ මොනවාදැයි විමසන ලදුව මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමාගෙන් සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරී ඩබ්.එම්.ජී වීරසිංහ මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරයේ නව තක්සේරුව අනුව දැනට තිබෙන අවම ලංසු මුදල වන රු.450,000 මුදල වැඩිකිරීමට විරුද්ධ වන බැවින් එම මුදලම අවම ලංසුව ලෙස යොදා ගැනීමට යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී, පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරයේ නව තක්සේරුව අනුව දැනට තිබෙන අවම ලංසු මුදල වන රු.450,000 මුදල 10%කින් වැඩිකිරීමට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී වසන්ත ගුණරත්න මැතිතුමා යෝජනා කරන ලදුව,ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, රජයේ නිවාඩු දින සඳහා මෙම කඩ කාමර වලින් අයකිරීම අසාධාරණ බව පවසන ලදුව සභාවේ මතය වූයේ එම දිනවලට අයකිරීම පිළිබඳව ටෙන්ඩර් කොන්දේසි තුළ අන්තර්ගත වී ඇති බවයි.

මෙහිදී, පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරයේ නව තක්සේරුව අනුව දැනට තිබෙන අවම ලංසු මුදල වන රු.450,000 මුදල 5%කින් වැඩිකිරීමට ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා යෝජනා කරන ලදුව, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර එකී මුදල 10%කින් වැඩි කිරීමට ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ප.ව.12.15 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවෙන් පිට වන ලදී.**

ඒ අනුව මේ සම්බන්ධව බෙදීමක් අවශ්‍ය බවටත් විවෘත ඡන්දයක් පැවැත්වීමටත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව මේ සම්බන්ධව සභාවේ විවිධ මත පළ වූ බැවින් පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරයේ අවම ලංසු මුදල 10% ක් වැඩිකිරීමේ යෝජනාව සඳහා පැවති විවෘත ඡන්ද විමසීමට අනුව යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 10 දෙනෙකු ද, එනම්,

01. ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
05. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රි එස්.යූ.සී. ජයනක මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රි එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා
09. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් 04 දෙනෙකුද, එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

ලෙස සභිකවරුන් ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට නොපැමිණි සභිකයාද, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා මෙම අවස්ථාව වන විට සභාවෙන් පිටව ගිය සභිකයාද වේ.

ඒ අනුව පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරයේ අවම ලංසු මුදල 10% ක් වැඩිකිරීමේ යෝජනාව වැඩි ඡන්ද 06 කින් සභා සම්මත විය.

පසුව පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය ටෙන්ඩර් කිරීමේ ටෙන්ඩර් ක්‍රමවේදය පිළිබඳව තීරණයක් ලබා ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එළ හරක් මස් කඩ කාමරය විවෘත ටෙන්ඩර් ක්‍රමවේදය මගින් ටෙන්ඩර් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පැවසූයේ තමන් එම අදහසට විරුද්ධ වන බවයි. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා අදහස් දක්වමින් එතුමාද විවෘත ටෙන්ඩර් කිරීමට සම්පූර්ණ විරුද්ධ වන බවත් බළන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට පමණක් ටෙන්ඩර් ලබා දිය යුතු බව එතුමාගේ අදහස බවත්, රජයේ අනුමත ඝෝගාතාකාරයකින් මස් රැගෙන ආ යුතු බවත්, සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අධීක්ෂණය අනිවාර්ය විය යුතු බවත් එසේ නොවන්නේ නම් තමන් නීත්‍යානූකූලව ක්‍රියා කරන බවත් පවසමින් දීර්ඝව අදහස් දක්වන ලදී.

ඒ අනුව මේ සම්බන්ධව බෙදීමක් අවශ්‍ය බවටත් විවෘත ඡන්දයක් පැවැත්වීමටත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. පසුව විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය විවෘත ටෙන්ඩර් කැඳවීමේ යෝජනාව සඳහා පැවති විවෘත ඡන්ද විමසීමට අනුව යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 10 දෙනෙකු ද, එනම්,

01. ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
05. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රි එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා
09. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් 04 දෙනෙකුද, එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

ලෙස සභිකවරුන් ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට නොපැමිණි සභිකයාද, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා මෙම අවස්ථාව වන විට සභාවෙන් පිටව ගිය සභිකයාද වේ.

ඒ අනුව පොදු වෙළඳසැළ අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය විවෘත ටෙන්ඩර් කැඳවීමේ යෝජනාව වැඩි ඡන්ද 06කින් සභා සම්මත විය.

**3.3 පොදු වෙළඳසැල අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරය**

පොදු වෙළඳසැළ අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ 2024.11.19 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් නව තක්සේරුව මත පදනම් වූ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල වන රු.22,600 මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

ඒ අනුව සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පොදු වෙළඳසැළ අංක 17 දරණ කුකුළු මස් කඩ කාමරයේ දැනට තිබෙන අවම ලංසු මුදල වන රු.22,600 මුදල යටතේ විවෘත ක්‍රමවේදය මගින් ටෙන්ඩර් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**4. පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය**

පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල වන රු.142,575 ක මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසුයේ බස් සංඛ්‍යාව විශාල ලෙස වැඩි වී ඇති බැවින් මෙම ටෙන්ඩරයේ අවම ලංසු මුදල අනිවාර්යෙන් වැඩි කළ යුතු බවයි.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසූයේ මේ වන විට බස් නැවතුම්පොළ පෞද්ගලික බස් 170 ක් පමණ තිබෙන බවත්, මෙම ටෙන්ඩරය සභාවෙන් කිරීමට යෝජනා කරන බවත්, මෙම බස් රථ නැවැත්වීමට එක් සුදුසු ස්ථානයක් නම් කර දිය යුතු බවත්, ඔවුන් පොදු වැසිකිළි භාවිතා කිරීමේදී මුදල් අයකිරීම අසාධාරණ බවත් අවම වශයෙන් එම පහසුකම හෝ ඔවුනට සපයා දිය යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රි එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මෙම බස් රථ හිමියන්ට මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය මඟින් ලබා දෙනු ලබන හැඳුනුම්පත භාවිතා කර නොමිලේ පොදු වැසිකිළි පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතු බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ප.ව.12.30 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

ගරු සභාපතිතුමා පැවසූයේ ලංකා බැංකුව පිටුපස ඉඩම රථ ගාලක් පවත්වා ගෙන යාම වෙනුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරන බවත් එවිට මෙම බස් ගාල් කිරීම වෙනුවෙන් එම ස්ථානය යොදා ගත හැකි බවත්ය.

ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා සභා සේවකයන් යොදවා මෙම ටෙන්ඩරය ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව සලකා බලා එය ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, එවිට සභාවේ ආදායම වැඩිකර ගැනීමේ හැකියාවක් පවතින බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය මේ පිළිබඳව නැවතත් අදහස් දක්වමින් දැනට බස් ගාල් ගාස්තු අයකරන්නේ පෞද්ගලික බස් රථ වලින් පමණක් බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ වලින් ගාස්තු අයකිරීමේ හැකියාවක් නැත්දැයි විමසන ලදුව ඊට අදාළව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරී ඩබ්.එම්.ජී වීරසිංහ මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඉහත අදහස් දැක්වීම්වලට අනුව පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2026 ජනවාරි සිට සභාවෙන් සිදු කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**5. බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය**

බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල වන රු.120,180 ක මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරයේ දැනට තිබෙන අවම ලංසු මුදල 25% කින් වැඩිකිරීමට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**6. මහජන පොළ ආපනශාලාව ටෙන්ඩරය**

මහජන පොළ ආපනශාලාව ටෙන්ඩරයේ දැනට තිබෙන ටෙන්ඩර් කොන්දේසි සංශෝධනය කිරීමට සහ දැනට ක්‍රියාත්මක වන අවම ලංසු මුදල වන රු.15,000 ක මුදල සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, යෝජනා ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන සිදුකර ගන්නා ලෙස ගරු සභාපතිතුමා සභාවට පවසන ලදී.

මහජන පොළ ආපනශාලාවේ දැනට තිබෙන අවම ලංසු මුදල වන රු.15,000 මුදල යටතේ ටෙන්ඩර් කිරීමට ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින විශේෂ සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් ප.ව. 12.43 ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

කේ. ජී.පේමදාස,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.